

اليوم الآخر ـ سنهالي

# අවසාන දිනය

جمعية الدعوة بالزلفي

جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالزلفي

69

هاتف: ٤٢٣٤٤٦٦ ٠١٦ ـ فاكس: ٤٢٣٤٤٧٧ ٠١٦

# අවසාන දිනය

## اليوم الآخر – اللغة السنهالية

جمعية الدعوة والإرشاد وتوعية الجاليات في الزلفي
Tel: 966 164234466 - Fax: 966 164234477

# اليوم الآخر

**أعده وترجمه إلى اللغة السنهالية:**

**جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالزلفي**

**الطبعة السادسة: ١٤٤٢/٩ هـ**

**ح شعبة توعية الجاليات بالزلفي، ١٤٢٠هـ**

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر
شعبة توعية الجاليات بالزلفي
اليوم الآخر – الزلفي ، ١٤٢٠ هـ
٢٨ ص؛ ١٢ × ١٧ سم
ردمك : ٥-٦٦- ٨١٣-٩٩٦٠
(النص باللغة السنهالية )
١-القيامة أ. العنوان
ديوي ٢٤٣ ٢٠/١٦٠٨

**رقم الإيداع : ٢٠/١٦٠٨**
**ردمك : ٥-٦٦- ٨١٣-٩٩٦٠**

# أحكام اليوم الآخر

ප්‍රශංසා සියල්ල විශ්වයේ පාලකයා වූ අල්ලාහ්ටම හිමි වේ. ඔහුගේ කරුණාව හා ආශිර්වාදය ශ්‍රේෂ්ඨ වන්නයාවූ නබිනායක මුහම්මදු (සල්) තුමාටද එතුමාගේ පවුලේ අයටද එතුමාගේ ශ්‍රාව කරුවන්ටද හා අප සැම දෙනාටද ලැබෙනු මැනව.

නියතව, ඊමාන් (විශ්වාස) කළ යුතු මූලික කරුණු හයකි. අවසාන දිනය පිළිබඳව විශ්වාස කිරීම ඒවායින් පස්වන කරු ණකි. මෙම දිනය පිළිබඳව කුර්ආනය හා නබිනායක මුහම්මදු (සල්) තුමාගේ සුන්නාව (යහමග) මගින් සනාථකර ඇති දේ විශ්වාස කරනතුරු කෙනෙකු විශ්වාසියෙක් විය නොහැක.

අවසාන දිනය පිළිබඳව දැනගැනීම හා ඒ ගැන අධික ලෙස සිහිකිරීම වැදගත්ය. මක්නිසාද, එය මිනිස් සිත්සතන්තුල ගුණ යහපත්කම ඇති කිරීමටත්, ඔහු බිය භක්තිකයෙකු කිරීමටත්, ඔහු අල්ලාහ්ගේ දහමෙහි ස්ථිරවීමටත් ඉමහත් හේතුවේ. මෙම දිනය, එහි නොසන්සුන්තා හා අසීරුතාවයන් ගැන නොසිතා අමතකවනු සේ ඔහුගේ හිත ගල්කර, පාප ක්‍රියාවන් කරා යොමු කරන දේ කුමක් විය යුතුද ?. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿يَوْمًا يَجْعَلُ الْوِلْدَانَ شِيبًا﴾ [المزمل:١٧]

එදින ළදරුවන් (කෙස් පැහුණු) මහල්ලන් කරයි.

*(අල්කුර්ආන්-73:17)*

﴿يَاأَيُّهَا النَّاسُ اتَّقُوْا رَبَّكُمْ، إِنَّ زَلْزَلَةَ السَّاعَةِ شَيْءٌ عَظِيْمٌ، يَوْمَ تَرَوْنَهَا تَذْهَلُ كُلُّ مُرْضِعَةٍ عَمَّا ارْضَعَتْ وَتَضَعُ كُلُّ ذَاتِ حَمْلٍ حَمْلَهَا وَتَرَى النَّاسَ سُكَارَى وَمَا هُمْ بِسُكَارَى وَلَكِنَّ عَذَابَ اللهِ شَدِيْدٌ﴾ [الحج:١،٢]

මිනිසුනි, ඔබලාගේ ස්වාමියා කෙරෙහි බියකමෙන් සිටින්න. නියතව, එම (අවසාන දින) අවස්ථාවේ කම්පනය (ඉතා) විශේෂ සිදුවීමකි. එදින කිරි පොවමින් සිටින සෑම මවකම තමා කිරි පොවන දරුවා අමතක කිරීමද සෑම ගර්භනී මාතාවන්ම තමන් ගේ බර පිදීමද ඔබ දකී. තවද, මිනිසුන් (බියෙන්) බුද්ධිය මුලාවී සිටීමද ඔබ දකී. නමුත්, ඔවුහු (මත්පැන්වලින් ඇතිවූ) මුලාවීම කින් සිටින්නන් නොවේ. නමුදු අල්ලාහ්ගේ දඬුවම ඉතා උග්‍රය.

*(අල්කුර්ආන්-22:1,2)*

# මරණය

1-මරණය මෙලොවෙහි ජීවත්වන සෑම දෙනාගේම අවසානයකි. මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿كُلُّ نَفْسٍ ذَائِقَةُ الْمَوْتِ﴾ [آل عمران :١٨٥]

සෑම ආත්මයක්ම මරණය (ට ලක්වී) භුක්ති විදිය යුතුයි. *(අල්කුර්ආන්-3:185)*

﴿كُلُّ مَنْ عَلَيْهَا فَانٍ﴾ [الرحمن :٢٦]

(පොළොවෙහි) ඇති සියල්ලක්ම විනාශවන්නේය.

*(අල්කුර්ආන්-55:26)*

﴿إِنَّكَ مَيِّتٌ وَإِنَّهُمْ مَيِّتُوْنَ﴾ [الزمر:٣٠]

(නබිතුමනි) නියතවශයෙන්ම, ඔබද මරනයට පත්වේ. තවද, නියතවශයෙන්ම ඔවුන්ද මරනයට පත්වෙති.
*(අල්කුර්ආන්-39:30)*

එහෙයින්, කිසියම් මිනිසෙකුට හෝ මෙලොවෙහි අමරණීය තත්ත්වයක් නොමැත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَمَاجَعَلْنَا لِبَشَرٍ مِّنْ قَبْلِكَ الْخُلْدَ﴾ [الأنبياء:٣٤]

(ඕ : නබි) තවද ඔබට පෙර කිසිඳු මිනිසෙකුට හෝ (මෙලො වෙහි) ස්ථිර(ජීවිත)යක් අපි ඇති නොකළෙමු.
*(අල්කුර්ආන්-21:34)*

මරනය, සැක කිරීමට කිසිඳු මගක් නොමැති නිශ්චිත කරු ණෙකි. එනමුත් මිනිසුන්ගෙන් බොහෝ දෙනා මේ පිළිබඳව අමතකයෙන් සිටිති. එනිසා මුස්ලිම්වරයෙකු මෙලොව විනාශ වීමට පෙර පරලොව සඳහා සූදානම් වන සේ මරනය ගැනද වැඩියෙන් සිහි කිරීම හා ඒ වෙනුවෙන් සූදානම් වීම අවශ්‍ය වේ. නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[إغْتَنِمْ خَمْسًا قَبْلَ خَمْسٍ ، حَيَاتَكَ قَبْلَ مَوْتِكَ ، وَصِحَّتَكَ قَبْلَ سَقْمِكَ ، وَفَرَاغَكَ قَبْلَ شُغْلِكَ ، وَشَبَابَكَ قَبْلَ هَرَمِكَ ، وَغِنَاكَ قَبْلَ فَقْرِكَ] (مسند الإمام أحمد)

(අවස්ථාවන්) පහට පෙර (අවස්ථාවන්) පහක් ප්‍රයෝජනවත් කරන්න. ඔබ, මරනයට පෙර ජීවිත කාලයද, ලෙඩවීමට පෙර නීරෝගී කාලයද, කාර්ය බහුලවීමට පෙර විවේක කාලයද, මහලුවීමට පෙර

යෞවන කාලයද, දිළිඳුවීමට පෙර ධනවත් කාලයද ප්‍රයෝජනවත් කර ගන්න. *(ග්‍රන්ථය : මුස්නද් අහ්මද්)*

දැනගන්න, මළමිනිය සමග මෙලොවේ කිසියම් දෙයක් හෝ මිනීවළ කරා ගෙනියනු නොලැබේ. සැබැවින්ම ඔහු සමග ඉතිරිව (පවති)න්නේ (රැඳී සිටින්නේ) ඔහුගේ ක්‍රියාව පමණි. එබැවින්, ඔබට සතුට ගෙන දෙන හා අල්ලාහ්ගේ අනුමැතිය මත වේදනාවෙන් ජය ලබාදෙන කුසල් ක්‍රියාවන් සූදානම් කිරී මට උනන්දුවිය යුතුයි.

2–මිනිසාගේ ආයුෂ කාලය අල්ලාහ් හැර අන් කිසිවෙක් හෝ නොදන්නා සැඟවුනු කරුණෙකි. එනිසා කිසියම් කෙනෙකු තමා කෙදින, කවර ස්ථානයේ මරණයට පත්වෙන්නේද, යන කරුණු ගැන නොදන්නේය. මක්තිසාදයත්, නිසැකයෙන්ම, මෙය අල්ලාහ් පමණක් දන්නා සැඟවූ කරුණෙකි.

3–මරණය පැමිණිවිට එයට බාධාකිරීම හෝ පමා කිරීම හෝ එය මගහැරමින් පැනදිවීම හෝ කළ නොහැක. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَلِكُلِّ أُمَّةٍ أَجَلٌ، فَإِذَا جَاءَ أَجَلُهُمْ لَايَسْتَأْخِرُوْنَ سَاعَةً وَّلَا يَسْتَقْدِمُوْنَ﴾ [الأعراف:٣٤]

සමාජයේ සැමටම (නිශ්චිත ආයුෂයක්) වාරයක් ඇත. ඔවුන් ගේ වාරය පැමිණෙන විට එය ප්‍රමාද කළ නොහැකිය. තවද, එය (නිශ්චිත වාරයට) පෙරද (සිදු) නොවන්නේය. *(අල්කුර්ආන්–7:34)*

4–විශ්වාස වන්තයෙකුට මරණය සිදුවන මොහොතේ ඔහු වෙත මලකුල් මව්ත් (පණ අත්පත්කරන සුරදූත) වරයා මිහිරි සුවඳ සෞන්දර්යමත් රූපයෙන් පැමිණේ. ඔහු හා

සමග ස්වර්ගය ගැන සුභාරංචි පතන කරුණාවන්ත මලක්වරුද පැමිණෙති. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿إِنَّ الَّذِيْنَ قَالُوْا رَبُّنَا اللهُ ثُمَّ اسْتَقَامُوْا تَتَنَزَّلُ عَلَيْهِمُ الْمَلاَئِكَةُ أَلاَّ تَخَافُوْا وَلاَتَحْزَنُوْا وَأَبْشِرُوْا بِالْجَنَّةِ الَّتِيْ كُنْتُمْ تُوْعَدُوْنَ﴾ [فصلت :٣٠]

කවරෙක් අප දෙවියා අල්ලාහ් බව ප්‍රකාශ කර, (එහි) ස්ථිර පැවැත්මෙන් සිටින්නේද, නිසැකයෙන්ම ඔවුන් වෙත මලක් වරුන් පැමිණ 'ඔබලා බිය නොවන්න, කණගාටු නොවන්න, ඔබලාට පොරොන්දුවූ ස්වර්ගය ගැන සතුටු වන්න' යනුවෙන් පවසති.

*(අල්කුර්ආන්-41:30)*

නමුදු ප්‍රතික්ෂේප කරන්නෙකුට මරණය සිදුවන මොහොතේ ඔහු වෙත මලකුල් මව්ත් (පණ අත්පත්කරන සුරදූත) වරයා දුගඳ ඇඳුම් පැළඳ තද කලු මුහුණෙන් බිය ජනික රූපයෙන් පැමිණේ. ඔහු හා සමග වේදනාව ගැන අවවාද කරන මලක් වරුන්ද පැමිණෙති. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَلَوْ تَرَى إِذِ الظَّالِمُوْنَ فِيْ غَمَرَاتِ الْمَوْتِ وَالْمَلاَئِكَةُ بَاسِطُوْا أَيْدِيْهِمْ ، اَخْرِجُوْا أَنْفُسَكُمْ، اَلْيَوْمَ تُجْزَوْنَ عَذَابَ الْهُوْنِ بِمَا كُنْتُمْ تَقُوْلُوْنَ عَلَى اللهِ غَيْرَ الْحَقِّ وَكُنْتُمْ عَنْ آيَاتِهِ تَسْتَكْبِرُوْنَ﴾ [الأنعام :٩٣]

අපරාධකරුවන් මරණ වේදනාවට ලක්ව සිටීම ඔවුහූ දකින් නේද, මලක්වරුන් තම දැත් දික්කරමින් 'ඔබලාගේ පණ පිට මත් කරන්න, අද දින ඔබලාට නින්දා දෙන වේදනාව කුලිය වශයෙන් ලැබේ.

මක්තිසාද යත්, ඔබලා අල්ලාහ් ගැන ව්‍යාජ කරුණු ප්‍රකාශකර සිටියහ. තවද, ඔහුගේ වැකි (අවිශ්වාස කර) අහංකාර කරමින් සිටියහ' යනුවෙන් පවසති.
*(අල්කුර්ආන්-6:93)*

එබැවින්, මරණය සිදුවන මොහොතේ මිනිසුන්ට සත්‍ය එළි වෙන අතර, ඔවුන් සැමට කරුණු පැහැදිළි වේ. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿حَتَّى إِذَا جَاءَ أَحَدَهُمُ الْمَوْتُ قَالَ رَبِّ ارْجِعُوْنِ، لَعَلِّيْ اَعْمَلُ صَالِحًا فِيْمَا تَرَكْتُ كَلاَّ ، إِنَّهَاكَلِمَةٌ هُوَ قَائِلُهَا ، وَمِنْ وَّرَائِهِمْ بَرْزَخٌ إِلَى يَوْمِ يُبْعَثُوْنَ﴾

**[المؤمنون:٩٩,١٠٠]**

ඔවුන්ගෙන් කෙනෙකුට මරණය සිදුවන විට ඔහු 'මගේ ස්වා මිනී, මා (ලොවෙහි) ඇර ආ දෙයින් කුසල් කිරීම සඳහා මාව නැවත (ලොවට කරා) හරවා එවන්න' යැයි පවසයි. කරුණු එසේනොවේ, ඔහු පවසන්නේ (අසත්‍ය) ප්‍රකාශයයි. නැගිට්ට වන දිනය තෙක් ඔවුන් ඉදිරියේ තිරයක් තිබේ. *(අල්කුර්ආන්-23:99,100)*

එබැවින්, මරණය සිදුවන විට ප්‍රතික්ෂේප කරන්නා (කාෆිර්) හා පාප කාරයා කුසල් ක්‍රියාවන්හි යෙදීම සඳහා මෙලොව කරා නැවත ඒම අපේක්ෂා කරයි. නමුත්, මෙලොව අතපසු වීමෙන් පසු කණගාටුවීමෙන් (කිසිඳු) පලක් නොවන්නේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَتَرَى الظَّالِمِيْنَ لَمَّا رَأَوُا الْعَذَابَ يَقُوْلُوْنَ هَلْ إِلَى مَرَدٍّ مِّنْ سَبِيْلٍ﴾

**[الشورى:٤٤]**

තවද, (ම් : නබි, සීමාව ඉක්මවා ගිය) අපරාධකරුවන් වේද නාව දකින අවස්ථාවේ එයින් වැළකී සිටීමට කිසියම් මගක් හෝ තිබේද ? යනුවෙන් ඔවුහු පැවැසීම ඔබ දකී. *(අල්කුර්ආන්-42:44)*

5-දාසයා පිළිබඳව අල්ලාහ්ගේ කරුණාව. එනම්, මරණයට පෙර කවරෙකුගේ අවසාන ප්‍රකාශය 'ලාඉලාහ ඉල්ලල්ලාහ්' බවට පවතින්නේද, ඔහු ස්වර්ගයෙහි පිවිසේ. මේ බව නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

**[مَنْ كَانَ آخِرُ كَلاَمِهِ مِنَ الدُّنْيَا لاَ إِلَهَ إِلاَّ اللهُ دَخَلَ الْجَنَّةَ]** (أخرجه أبو داود)

මෙලොවෙහි කවරෙකුගේ අවසන් ප්‍රකාශය 'ලා ඉලාහ ඉල් ලල්ලාහ්' යනුවෙන් පවතින්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ. *(ග්‍රන්ථය : අබූදාවූද්)*

චිත්ත පාරිශුද්ධ වන්තයා හැර අන් කවරෙකුට හෝ මෙවන් උවදුර අවස්ථාවේ මෙම කලිමාව පැවැසීමට නොහැක. චිත්ත පාරිශුද්ධිය නොවන්නා මරණ කලබලයෙහි සිදුවන අසීරුතා තත්ත්වය මත මෙම කලිමාව ප්‍රකාශ කිරීමෙන් වැළැකී සිටී. එහෙයින්, මරණය සිදුවන මොහොතේ ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් කියා දීම සතුටුදායක කරුණකි.

# කබ්ර්-මිනීවළ

නබිනායක මුහම්මදු (සල්) තුමා මිනීවළ පිළිබඳව පවසන්නේ මෙසේය.

[إِنَّ الْعَبْدَ إِذَا وُضِعَ فِيْ قَبْرِهِ وَتَوَلَّى عَنْهُ أَصْحَابُهُ ، إِنَّــهُ لَيَسْــمَعُ قَــرْعَ نعَالِهِمْ، قَالَ : فَيَأْتِيْهِ مَلَكَانِ فَيُقْعِدَانِهِ فَيَقُوْلاَنِ لَه : مَاكُنْتَ تَقُوْلُ فِيْ هَــذَا الرَّجُلِ ؟ قَالَ: فَأَمَّا الْمُؤْمِنُ فَيَقُوْلُ : أَشْهَدُ أَنَّهُ عَبْدُاللهِ وَرَسُــوْلُهُ ، قَــالَ فَيُقَالُ لَهُ : أُنْظُرْ إِلَى مَقْعَدِكَ مِنْ النَّارِ قَدْ أَبْدَلَكَ اللهُ بِهِ مَقْعَدًا فِي الْجَنَّــةِ. قَالَ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمْ : فَيَرَاهُمَا جَمِيْعًا. وَأَمَّا الْكَافِرُ أَوْ مُنَافِقُ فَيُقَالُ لَهُ مَاكُنْتَ تَقُوْلُ فِيْ هَذَا الرَّجُلِ ؟ فَيَقُوْلُ : لاَ أَدْرِيْ ، كُنْتُ أَقُوْلُ مَا يَقُــوْلُ النَّاسُ، فَيُقَالُ : لاَ دَرِيتَ وَلاَ تَلَيْتَ ، وَيُضرَبُ بِمَطَارِقَ مِنْ حَدِيْدٍ ضَرْبَةً ، فَيَصِيْحُ صَيْحَةً يَسْمَعْهَا مَنْ يَلِيْهِ إِلاَّ الثَّقَلَيْنِ] (سنن النسائى)

කෙනෙකු මිනීවළයෙහි තැන්පත්කර, ඔහුගේ මිත්‍රයන් ඔහු හැර ආපසු යනවිට ඔවුන්ගේ පාවහන්හි නාදය ඔහුට ඇසේ. එවිට එහි පැමිණෙන මලක්වරුන් දෙන්නෙක් ඔහුව වාඩිකරවා (කෙනෙකුව සංඥා කර) මෙම පුද්ගලයා පිළිබඳව ඔබ කුමක් ප්‍රකාශ කරමින් සිටියේද ? යනුවෙන් ඔහුගෙන් විමසති. එකළ විශ්වාස වන්තයා, ඔහු අල්ලාහ්ගේ දාසයා හා දූතයා බව සාක්ෂි පැතූ බව පවසයි. අපායයෙහි ඔබේ ආසනය (ස්ථානය) බලන්න. නිසැකයෙන්ම, අල්ලාහ් ඔබේ ආසනය ස්වර්ගයට මාරු කළේය' යනුවෙන් ඔහුට පැවැසේ. ඔහු එම ආසන දෙකම බලා සිටී.

තවද, අවිශ්වාස වන්තයා හෝ මුනාෆික්වරු (අවස්ථාවාදි)යා ගෙන් මෙම පුද්ගලයා පිළිබඳව ඔබ කුමක් ප්‍රකාශ කරමින් සිටි යේද ? යනුවෙන් විමසේ. ඔහු, මම නොදනිමි. මිනිසුන් ප්‍රකාශ කළ දේම මාද ප්‍රකාශ කරමින් සිටියෙමි යැයි පවසයි. එවිට 'ඔබ දැනගත්තේද, පිළිපැද්දේද නොමැත. යනුවෙන් ඔහුට පැවැසේ. පසුව, ඔහුහට යකඩ (තලන විශාල) මිටියකින් පහරක් දෙනු ලැබේ. එවිට ඔහු කෑකෝ ගසයි. එකී ශබ්දය මිනිස් සහ ජින් වර්ග හැර අන් සියලු දෙනාටම ඇසේ.

මිනීවළෙහි දේහයට නැවත පණ පොවීම පරලොව පිළිබඳ හා මෙලෝ මිනිස් නුවණට නොවටහන කරුණකි. මිනිසා ත්‍යාගයට සුදුසු විශ්වාස වන්තයෙකු නම්, මිනීවළෙහිද ඔහු ත්‍යාග ලබයි. ඔහු වේදනාවට සුදුස්සෙකු නම්, මිනීවළෙහිද ඔහු වේදනාව ලබයි. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ اَلنَّارُ يُعْرَضُوْنَ عَلَيْهَا غُدُوًّا وَّعَشِيًّا، وَيَوْمَ تَقُوْمُ السَّاعَةُ ، اَدْخِلُوْا آلَ فِرْعَوْنَ أَشَدَّ الْعَذَابِ ﴾ [غافر:٤٦]

උදේ හා සවස ඔවුන් නරකාදියේ ගින්න ඉදිරියට ගෙනෙනු ලැබේ. තවද විනිශ්චය කිරීම සිදුවන අවසන් දිනයේ (වේලාවේ) 'ෆිර්අවුන්ගේ කල්ලිය උග්‍ර ලෙස දඬුවමට ලක් කරන්න (යනු වෙන් මලක්වරුන්ට පැවැසේ) *(අල්කුර්ආන්-40:46)*

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[ تَعَوَّذُوا بِاللهِ مِنْ عَذَابِ الْقَبْرِ ] (أخرجه أبو داود)

ඔබලා මිනීවළ වේදනා පිළිබඳව අල්ලාහ් වෙතින් ආරක්ෂාව පතන්න. *(ග්‍රන්ථය : අබූදාවූද්)*

නිවැරදි බුද්ධිමතා මිනීවළ වේදනාව ප්‍රතික්ෂේප නොකරයි. මන්දයත්, මිනිසා තම ජීවිතයේද මෙය සමීපව බව දකී. එනම්, නින්දයෙහි පසුවන්නා තමා දැඩි වේදනාවට ලක්වන බව (සිහි නයෙන්) හැඟී කැකෝ ගසා රැකවරණය පතයි. මරණය සහ ජීවිතය අතර විශාල වෙනසක් පවතින අතර, ඔහු අසලෙහිම සිටින්නාට පවා මෙය නොහැඟෙන්නේය. මිනීවළෙහි වේදනාව පණට හා දේහයට (එකට) සිදුවේ.

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

**[اَلْقَبْرُ أَوَّلُ مَنَازِلِ الْآخِرَةِ ، فَإِنْ نَجا مِنْهُ فَمَا بَعْدَهُ أَيْسَرُ مِنْهُ ، وَإِنْ لَمْ يَنْجُ مِنْهُ فَمَا بَعْدَهُ أَشَدُّ مِنْهُ]** (أخرجه الترمذي)

මිනීවළ පරලොවෙහි නවාතැන්වලින් පළමු තැනකි. මෙයින් කෙනෙකු ජය ලැබුවේනම්, ඔහුට මින් පසු සිදුවන දේ මෙයට වඩා පහසුවේ. මෙයින් කෙනෙකු ජය නොලැබුවෙ නම්, ඔහුට මින් පසු සිදුවන දේ මෙයට වඩා අපහසු වේ. *(ග්‍රන්ථය : තිර්මිදී)*

එබැවින් මුස්ලිම්වරයෙක් මිනීවළෙහි වේදනාවෙන් (ජය ලබා ගැනීම සඳහා) අධික වශයෙන් රැකවරණය පැතීම අනිවාර්ය වේ. විශේෂයෙන්, නැමදුමෙහි සලාම් කීමට පෙර රැකවරණය පැතිය යුතුයි. එසේම මිනීවළ හා නිරයෙහි වේදනාවට මූලික කාරණා වන්වන පාප ක්‍රියාවලින් ඈත්වීමට ඇල්ම විය යුතුයි. මෙයට මිනී වළ වේදනාව යනුවෙන් හැඳින්වන්නේ, මිනිසුන්ගෙන් බොහෝ දෙනා

මිනීවළෙහි භූමිදානය කිරීම නිසාය. එසේ නොවන අය එනම් දියට ගිලීගිය, ගින්නට දැවුනු, සතුන් (හපා) කාපු සහ මෙවන් අය පරලොවෙහි ත්‍යාග හෝ වේදනාව ලබති.

මිනීවළ වේදනාව විවිධ ආකාරයෙන් සිදුවේ. එය යකඩ වැනි (ලොකු) මිටියෙන් පහර දීම, ඔහුගේ මිනීවළය අන්ධකාරයෙන් පිරීම, අපායේ ඇතිරිල්ලක් ඔහුට දිගහැරීම, අපායේ දොරටුවක් ඔහුට විවෘත කිරීම, ඔහුගේ අකුසල් (ක්‍රියාවන්) දුගඳ ඇඳුම් ඇඳ පිළිකුල් මුහුණු වරයකින් යුත් මිනිසෙකුගේ රූපයෙන් ඔහු හා සමග වාඩිවීම යනාදීන්ය.

දාසයා අවිශ්වාසියෙක් හෝ අවස්ථාවාදියෙක් හෝ වන්නේ නම්, වේදනාව ස්ථිරයෙන් පවතී. දාසයා පාපකාර විශ්වාසියෙක් නම්, එවිට ඔහුගේ පාප ක්‍රියාවන් අනුව වේදනාවන්ද වෙනස් වේ. (පසුව) ඔහු එයින් නිදහස් වේ.

දාසයා විස්වාසියෙකු නම්, ඔහු මිනීවළයෙහි අල්ලාහ්ගෙන් කරුණාව ලබයි. එනම්, ඔහුගේ මිනීවළය විශාල කෙරේ. එය ආලෝකයෙන් පිරේ. ස්වර්ගය කරා ඔහුට දොරටුවක් විවෘතවේ. එමගින් ඔහුට සුගන්ධය අනුභව කරයි. ස්වර්ගයේ ඇතිරිල්ලක් ඔහුට දිගහැරේ. ඔහුගේ කුසල් ක්‍රියාවන් සෞන්දර්ය මිනිසෙකු ගේ රූපයෙන් පැමිණ මිනීවළෙහි ඔහු සමග කතා බහ කරයි.

# අවසාන දිනය හා එහි සළකුණු

1-අල්ලාහ් මෙලොව ස්ථිරව පැවැත්වීම සඳහා නිර්මානය කළේ නැත. එනිසා එයට අවසාන දිනයක් ඒවි. එය විනිශ්චය ලබා දෙන දිනයක් වන අතර, මෙය සත්සුදක්සේ සත්‍යය කරු ණකි. අල්ලාහ් මේ බව මෙසේ පවසනන්නේය.

﴿وَأَنَّ السَّاعَةَ آتِيَةٌ لَّارَيْبَ فِيْهَا﴾ [الحج:٧]

තවද, නියත වශයෙන්ම, පරලොව (වේලාව) පැමිණේ. මෙහි කිසිඳු සැකයක් හෝ නොමැත. *(අල්කුර්ආන්-22:7)*

﴿وَقَالَ الَّذِينَ كَفَرُوا لا تَأْتِينَا السَّاعَةُ قُلْ بَلَى وَرَبِّي لَتَأْتِيَنَّكُمْ﴾ [سبأ :٣]

තවද, කාෆිර්වරුන් '(විනිශ්චය කරන පරලොව) වේලාව අපට නොපැමිණේ' යනුවෙන් පවසති. (නබිතුමනී) 'මාගේ දෙවියා මත දිවුරා කියමි. (එසේනොවේ) නිශ්චය වශයෙන්ම (එය) ඔබලා වෙත පැමිණේ' යනුවෙන් ඔබ පවසන්න. *(අල්කුර්ආන්-34:3)*
අවසාන දිනය සමීපව පවතින බව අල්ලාහ් පහත සඳහන් වැකි මගින් පවසන්නේය.

﴿إِقْتَرَبَتِ السَّاعَةُ﴾ [القمر:١]

(අවසාන) වේලාව සමීපව පැමිණ ඇත. *(අල්කුර්ආන්-54:1)*

﴿إِقْتَرَبَ لِلنَّاسِ حِسَابُهُمْ وَهُمْ فِيْ غَفْلَةٍ مُعْرِضُوْنَ﴾ [الأنبياء:١]

මිනිසුන්ට ඔවුන්ගේ ගණන් බැලී (ප්‍රශ්න කිරී)මේ දිනය ඉතා සමීපව පවතී. එනමුත් ඔවුහු (එය) ප්‍රතික්ෂේප කරන් නන් සේ නොසළකා සිටිති.
*(අල්කුර්ආන්-21:1)*

අවසාන දිනය සමීපව පවතිම මිනිස් අනුමානයෙන් දැනගැනී මක් නොවේ. එය ඔවුන් දැන ගැනීමටද නොහැක. නමුත්, අල්ලාහ්ගේ ඥානය සහ ලොවෙ හි ගෙවීගිය කාලය අනුව අනුමානය කළ හැකිය. අවසාන දිනය පිළිබඳ දැනුම යනු, එය අල්ලාහ් තම ඥානයෙන් හිමිකරගත් සැඟවූ කරුණකි. ඔහු තම නිර්මානවලින් කිසිවෙකුට හෝ මෙය පැහැදිළිකර නොමැත. අල්ලාහ් මේ ගැන මෙසේ පවසන්නේය.

﴿يَسْأَلُكَ النّاسُ عَنِ السَّاعَةِ ، قُلْ إِنَّمَا عِلْمُهَا عِنْدَ اللهِ ، وَمَا يُدْرِيْكَ لَعَلَّ السَّاعَةَ تَكُوْنُ قَرِيْبًا﴾ [الأحزاب:٦٣]

(ඕ : නබි, විනිශ්චයට අයත්) එම වේලාව පිළිබඳව මිනිසුන් ඔබෙන් විමසන්නෝය. (එයට) ඒ පිළිබඳ ඥානය අල්ලාහ් සතුව (පමණක්) ඇති බව (ඔවුන්ට ඔබ) පවසන්න. එය සමී පයෙන් පැමිණීමට හැකි බව ඔබට දැනුම් දුන්නේ කුමක්ද ? *(අල්කුර්ආන්-33:63)*

නබි මුහම්මදු (සල්) තුමා අවසාන දිනය සමීපයෙන් පැවැ තිම පිළිබඳ සළකුණු (කීපයක්) පවසන්නේය.

මසීහුද් දජ්ජාල් පිටවීම හා එමගින් මිනිසුන් ඉතා නොසත් සුන්තාවයට පත්වීමද මෙයින් එකකි. මිනිසුන්ගෙන් බොහෝ දෙනා රැවටෙන අන්දමට (සාමාන්‍ය පැවැත්ම නොවන) ආශ් චර්ය කාර්යයන්

කිරීම සඳහා අල්ලාහ් ඔහුට ශක්තිය ලබා දෙයි. ඔහු වැහි වැසීම සඳහා අහසට අණකරන කළ අහස වස්ස වයි. (පැලෑටි වර්ග) පැලවීම සඳහා (පොළොවට) අණ කරන කළ එය පැල වේ. මළවුවන් ජීවත් කරවයි. එසේම, මෙවන් වෙනත් ආශ්වර්ය කාර්යයන්ද ඔහු කරයි.

නබි මුහම්මදු (සල්) තුමා ඔහු ගැන මෙසේ පවසන්නේය.

ඒක නෙතකින් සිටින ඔහු ස්වර්ගය හා අපාය ගෙන එයි. ඔහු ස්වර්ගය බව පවසන්නේ නම්, එය අපායකි. ඔහු අපාය බව පවසන්නේ නම්, එය ස්වර්ගයකි. ඔහු පොළොවෙහි දින හතලිහක් (40) රැඳී සිටී. එහි එක් දිනයක් එක් වසරක් වශ යෙන්ද, තවත් දිනයක් එක් මාසයක් වශයෙන්ද, තවත් දින යක් එක් සතියක් වශයෙන්ද, ඉතිරි දිනයන් සාමාන්‍ය දින යන් වශයෙන්ද පවතී. පොළොවෙහි මක්කාව සහ මදීනාව හැර ඔහු සෑම ස්ථානයකම ගැවෙසේ.

ඊසා (ජේසුස්) නබිතුමා සුභන් නැමදුම වේලාවේ ඩමස්කස් ප්‍රදේශයේ පිහිටි ධවල ගෝපුරයෙන් බැස ඒමද අවසන් දිනය පිළිබඳ සළකුණුවලින් එකකි. මිනිසුන් සමග සුභන් සලාතය ඉටු කරන එතුමා පසුව දජ්ජාලය සොයා මරා දමයි. ඉර බස්නාහිරෙන් උදාවීමද අවසාන දිනයේ සළකුණක්ය. මෙය දකින මිනිසුන් මැවිලී විශ්වාස කරති. මෙවන් විශ්වසයෙන් ඔවුන්ට කිසිදු පලක් හෝ නොලැබේ. අවසාන දිනය පිළිබඳ වෙනත් සළකුණු කීපයක්ද ඇත්තේය.

2–අවසාන දිනය සිදුවන්නේ පාපකාර මිනිසුන් සඳහාය. එදිනය සිදුවීමට පෙර අල්ලාහ් සුවඳ මඳ සුළඟක් එවයි. එය විශ්වාස වන්තයින්ගේ ප්‍රාණ අත්පත් කරයි. මරණයට පත් කිරීම හා මෙලොව අවසන් කිරීම මගින් මැවීම් කෙරෙහි තීරණයක් ගැනීමට අල්ලාහ් අදහස් කළේනම්, ඔහු සූර්හි පිඹින ලෙස (අදාල) මලක් (සුරදූත) වරයාට අණ කරයි. (සූර් යනු මහා අඟකි) එම නාදයට සවන්දෙන මිනිසුන් මුළාවෙති. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿وَنُفِخَ فِي الصُّوْرِ فَصَعِقَ مَنْ فِي السَّمَوَاتِ وَمَنْ فِي الأَرْضِ إِلاَّ مَنْ شَاءَ اللهُ﴾ [الزمر:٦٨]

තවද සූර් (නලාවෙ)හි පිඹිනු ලැබේ. පසුව, අල්ලාහ් කැමැති වූ අය හැර අහසෙහි හා පොළොවෙහි සිටින්නන් (සියළුම දෙනා) සිහිය නැතිව මුළාවෙති.
*(අල්කුර්ආන්–39:68)*

අවසන් දිනය සිකුරාදා දිනයක සිදු වේ. පසුව සෑම මලක් වරුන්ම මරණයට පත්වේ. අල්ලාහ් හැර අන් කිසියම් දෙයක් හෝ ඉතිරිව නොපවතී.

3–මිනිස් ශරීරයේ ඇති ‘අජ්බුත්දනබ්’ යනු ඇටකටුව හැර අන් සියල්ලම විනාශවී ඒ සියල්ල පොළොව අනුභව කරයි. අජ් –බුත්දනබ් යනු මූලමයකි. එය මිනිසාගේ පිට දණ්ඩ අව සානයේ ඇති ඇටකටුවකි) සැබැවින්ම, නබි (වක්තෘ)වරුන් ගේද පරිත්‍යාගශීලීන් (ෂහීද්වරුන්)ගේද දේහයන් පොළොව අනුභව නොකරයි. අල්ලාහ් අහසෙන් ජලය ඉසා (විනාශවූ)

ශරීරයන් වර්ධනය කරයි. අල්ලාහ් මිනිසුන් නැගිටට වීමට අදහස් කරනවිට ඔහු සූර් පිඹීම භාර ඉස්රාෆීල් මලක්වරයාට පණ ලබාදෙයි. එතුමා දෙවැනි වරට සූර්හි පිඹනවිට අල්ලාහ් සියලුම මැවීම්වලට පණ ලබාදෙයි. එවිට මිනිසුන් ප්‍රථමයෙන් පාවහන් නොපැළඳ, නිර්වස්ත්‍රයන් හා චර්මඡේදය (කත්නා) නොකර අල්ලාහ් මැවූ සේ ඔවුන් තම සමාධිවල සිට පිටත් වෙති. අල්ලාහ් මේ ගැන මෙසේ පවසන්නේය.

﴿وَنُفِخَ فِى الصُّوْرِ فَإِذَاهُمْ مِّنَ الْأَ جْدَاثِ إِلَى رَبِّهِمْ يَنْسِلُوْنَ﴾ [يس :٥١]

සූර් (යන නලාවෙ)හි පිඹනු ලැබේ. එවිට ඔවුහූ සමාධිවලින් (පිටත්වවී) තම ස්වාමියා කරා සීඝ්‍රයෙන් ගමන් කරති. *(අල්කුර්ආන්-36:51)*

﴿يَوْمَ يَخْرُجُوْنَ مِنَ الْأَ جْدَاثِ سِرَاعًا كَأَنَّهُمْ إِلَى نُصُبٍ يُوْفِضُوْنَ، خَاشِعَةً أَبْصَارُهُمْ تَرْهَقُهُمْ ذِلَّةٌ ، ذَالِكَ الْيَوْمُ الَّذِىْ كَانُوْا يُوْعَدُوْنَ﴾

[ المعارج: ٤٣،٤٤]

(ප්‍රතික්ෂේප කරන්නන්වූ) ඔවුහු සිටුවා ඇති දේ (වූ පිලිම යන්) කරා සීඝ්‍රයෙන් ගමන් කරන්නන් සේම එදින සමාධි වල සිට සීඝ්‍රයෙන් පිටත්වෙති. ඔවුන්ගේ බැල්ම බිම් බලා තිබේ. නින්දාව ඔවුන් පරිවරා (වටා) ගෙනේ. මෙය ඔවුන්ට පොරොන්දුවූ දිනයම වේ.

*(අල්කුර්ආන්-70:43,44)*

මෙම පොළෝ තලය පැලී (පිපිරී) එමගින් ප්‍රථමයෙන් පිටත් වන්නේ නබිනායක මුහම්මදු (සල්) තුමාය. මේ බව එතුමා මගින් අනාවරණය වී ඇත. පසුව මිනිසුන් (පරලොව දිනයේ) මහ්ෂර් පිටියට ගෙනෙනු ලැබේ. එය

මහා විශාලවත් පොළොවෙකි. කාෆිර්වරුන් එහි මූණින්තලාවයෙන් රැස්කරනු ලැබේ. මූණින් තලාවයෙන් කෙසේ රැස්කරනු ලබන්නේද? යනුවෙන් නබිතුමා ගෙන් විමසූහ. එවිට නබිනායකතුමා 'ඔවුන්ව පාදයෙන් ඇවිද්ද වූ තැනැත්තා මූණින්තලාවයෙන් ඇවිද්දවීමටද ශක්ති වන්තයාය' යනුවෙන් පැවැසීය) තවද, අල්ලාහ් සිහිකිරීම උදාසීන කරන්නා අන්ධයා ලෙසද නැගිටවේ.

එදින ඉර මැවිල්ලයන් සමීපව පවතී. මැවිල්ලයන් ඔවුන්ගේ ක්‍රියාවන්හි ප්‍රමාණය අනුව දහඩියෙන් සිටිති. ඔවුන්ගෙන් විලුඹ දක්වාද ඉණ දක්වාද දහඩියෙන් සිටින අයද මුලු ශරීරයම දහඩි යෙන් ගිලා බැසී සිටින අයද සිටිති. අල්ලාහ්ගේ සෙවණැල්ල හැර අන් කිසියම් සෙවණැල්ලක් හෝ නොමැති එම දිනයේ ඔහුගේ සෙවණැල්ල ලබන අයද සිටිති. නබිනායක මුහම්මදු (සල්) තුමා මේ ගැන මෙලෙස පවසන්නේය.

[سَبْعَةٌ يُظِلُّهُمُ اللهُ فِيْ ظِلِّهِ يَوْمَ لاَ ظِلَّ إِلاَّ ظِلُّهُ : إِمَامٌ عَادِلٌ ، وَشَابٌّ نَشَأَ فِيْ طَاعَةِ اللهِ، وَرَجلٌ مُعَلَّقٌ قَلْبُهُ فِي الْمَسَاجِدِ، وَرَجلاَنِ تَحَابَّا فِي اللهِ اِجْتَمَعَا عَلَيْهِ وَتَفَرَّقَا عَلَيْهِ، وَرَجلٌ دَعَتْهُ إِمْرَءَةٌ ذَاتُ مَنْصِبٍ وَجَمَالٍ فَقَالَ إِنِّيْ أَخَافُ اللهَ، وَرَجلٌ تَصَدَّقَ بِصَدَقَةٍ فَأَخْفَاهَا حَتَّى لاّ تَعْلَمَ شِمَالُهُ مَا أَنْفَقَتْ يَمِيْنُهُ، وَرَجلٌ ذَكَرَ اللهَ خَالِيًا فَفَاضَتْ عَيْنَاهُ] (رواه مسلم)

අල්ලාහ්ගේ සෙවණැල්ල හැර කිසියම් සෙවණැල්ලක් හෝ නොමැති එම දිනයේ අල්ලාහ් හත් දෙනකුට (පමණක්) තමාගේ සෙවණැල්ල ලබා දෙයි. ඔවුහූ, යුතුකමින් ක්‍රියා කළ නායකයාද, අල්ලාහ්ට අවනත වීමෙහි නිරතවූ

තරුණයාද, මස්ජිදය (දේවස් ථානය) කරා තම සිත යොමුකර සිටින මිනිසාද, අල්ලාහ් වෙනු වෙන් ආදරයකර ඒ සඳහා එක්වූ හා ඒ සඳහා වෙන්වූ දෙන්නාද, උසස් වංශයෙන් හා සෞන්දර්යයෙන් යුත් ස්ත්‍රියෙක් නපුරු ක්‍රියා වක් සඳහා ආරාධනා කළ විට 'මා අල්ලාහ් කෙරෙහි බියට පසු වෙමි' යනුවෙන් පවසා (වැළකී) සිටි මිනිසාද, තම දකුණු අතින් කරන දානය (පිං) තම වම අත නොදැන පරිදි සැඟවූ මිනිසාද, තනිවම සිට (අල්ලාහ් කෙරෙහි සිහි කිරීමෙන්) නෙත දෙකෙහි කඳුලු හැලූ මිනිසාද වේ.

*(ග්‍රන්ථය : මුස්ලිම්)*

මෙය පිරිමින්ට පමණක් සීමාවූ එකක් නොවන්නේය. ස්ත්‍රීන් ද ඔවුන්ගේ ක්‍රියාවන් වෙනුවෙන් ප්‍රශ්න කෙරේ. ඒවා කුසල්නම් කුසලද, (ත්‍යාගද) අකුසල්ම් අකුසලද (වේදනාද) ලබති. කුලිය දීම හා ප්‍රශ්න කිරීම පිරිමීන්ට සේම ස්ත්‍රීන්ටද පොදුවෙන් පවතී. පනස් දහස් වසරකට සමාන මෙම දිනයේ මහ්ෂර්හිදී මිනිසුන් අධික ලෙස පිපාසයෙන් සිටිති. නමුදු විශ්වාසියෙට (මෙම දිනය) එක සලාතයක් ඉටුකරන වේලාවක් සේ සීග්‍රයෙන් පවතී.

විශ්වාස වන්තයින් නබිනායක තුමාගේ පොකුණට (හව්ල්) පැමිණ, එයින් ජලය පානය කරති. හව්ල් යනු, අල්ලාහ් නබි නායක තුමාට පමණක් විශේෂයෙන් පිරිනමා ඇති ශ්‍රේෂ්ඨමත් පොකුණකි. එතුමාගේ සමාජයින් අවසාන දිනයේ මෙහි ජලය පානය කරති. මෙම ජලය කිරියට වඩා තදම සුදය. මී පැණියට වඩා රසය. කපුරුවට වඩා සුවඳය. එහි භාජන අහසේ තරුවන් ගේ සංක්‍යාවකි. මෙම පොකුණෙන් වරක් ජලය පානය කරන් නාට කිසිදා පිපාසයක් ඇති නොවන්නේය.

මිනිසුන් මහ්ෂර් පිටියේ දීර්ඝ කාලයක් රැඳී සිට ඔවුන් අතර ප්‍රශ්න කිරිම හා තීන්දු කිරීම අපේක්ෂා කරමින් සිටිති. ඔවුන් අධික උෂ්ණයට හා අසීරුතාවයට පත්ව සිටින අතර, එහි රැඳී සිටීමද, අපේක්ෂාවද දීර්ග වේ. එවිට නිර්මාණයන් අතර තීන්දු කිරීම සඳහා අල්ලාහ් හමුවට නිර්දේශ කරන්නන් සොයා යති. ඔවුන් ප්‍රථමයෙන් නබි ආදම් (අලෛ) තුමා වෙතට පැමිණෙති. එතුමා තමා නොහැකිභාවය පවසයි. පසුව ඔවුහු නූහ් (අලෛ), ඉබ්‍රාහීම් (අලෛ), මූසා (අලෛ) හා ඊසා (අලෛ) යන වක්තෘ වරුන් වෙතට (මැදිහත්වීම සඳහා) පැමිණෙති. එතුමන්ලාද තම තමන්ගේ නොහැකිභාවය පවසා වැළකී සිටිති.

පසුව, (අවසාන වශයෙන්) නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත ඔවුන් පැමිණෙති. එතුමා මෙයට තමා සුදුස්සා බව පවසා (පිළිගෙන) අර්ෂ (අල්ලාහ්ගේ සිංහාසන)යේ අභියස සුජූදයෙහි යෙදී සිට අල්ලාහ් එතුමාට පහළකළ පරිදි ඔහුව සම්පූර්ණයෙන් ප්‍රශංසා කරමින් සිටී. එවිට අල්ලාහ් 'ඕ : මුහම්මද් ඔබගේ හිස ඔසවා ඔබ අයැදින්න. එය ඔබට ලැබේ. ඔබ නිර්දේශ කරන්න, එය පිළිගෙනේ' යනුවෙන් පවසා විනිශ්චය කිරීමට හා ප්‍රශ්න කිරීම සඳහා අල්ලාහ් අවසරය ලබාදෙයි. ප්‍රථමයෙන් ප්‍රශ්න කිරී මට ලක් වන්නේ නබිනායක මුහම්මදු (සල්) තුමාගේ උම්මත් හෙවත් සමාජයින්ය.

මිනිසුන්ගේ ක්‍රියාවන් අතර ප්‍රථම වශයෙන් ප්‍රශ්න කරනු ලබන්නේ සලාතය (නැමදුම) ගැනය. එය සතුටුදායකව පිළිගනු ලබන්නේ නම්, පසුව වෙනත් ක්‍රියාවන් ගැන අවධානය යොමු කෙරේ. නැමදුම

ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම්, ඔහුගේ සියළුම ක්‍රියාවන්ද ප්‍රතික්ෂේප කෙරේ. එසේම, දාසයා කරුණු පහක් ගැන ප්‍රශ්න කරනු ලැබේ. එවා, ඔහු තම ගැවූ ආයුෂ කාලය කෙසේ ගත කළේද ? තම ගැවූ යෞවනය කෙසේ පල කළේද ? තම ධනය කෙසේ රැස් කළේද ? එය කෙසේ වියදම් කළේද ? තමා ලද දැනුම් ඥානයෙන් කුමණ ක්‍රියා කළේද ? යනාදීන්ය.

එසේම, මිනිසුන් අතර ලේ (ඝාතන හා තුවාල කිරීම් වැනි කාර්යයන්) ගැනද ප්‍රශ්න කරනු ලැබේ.

එදින පළිගැනීම් කරනු ලබන්නේ, කුසල් හා අකුසල් ක්‍රියා වන් මගිනි. පුද්ගලයෙකුගේ කුසල් ඔහුගෙන් පීඩනයට ලක්වූ අයට පිරිනමනු ලැබේ. ඔහුගේ කුසල් අවසන් වූයේනම්, පීඩන යට ලක්වූවන්ගේ අකුසල් ඔහු මත පටවනු ලැබේ. පසුව කෙස් ගහට වඩා සිනිඳු හා කඩුවට වඩා තියුණුවූ සිරාත් යනු පාලමක් අපාය මත පිහිටේ. මිනිසුන් තමන්ගේ ක්‍රියාවන් අනුව එය පසු කර යති. ඔවුනතර ඇසිපිය ගැසීමේ මොහොතේද, සුළඟ වේග යෙන්ද, අධි සීඝ්‍රයෙන් දුවන අශ්වයන් සේද හා බඩ ගැමෙන්ද සිරාතය පසු කරන්නන්ද සිටිති, එහි මත ඇති දම්වැල් මිනිසුන් අල්ලා අපායතුල වීසි කරයි. එවිට කාෆිර්වරු හා අල්ලාහ් සිතන පාපකාර විශ්වාසීන් එහි වැටෙති. නිසැකයෙන්ම, කාෆිර්වරුන් නිරයේ ස්ථිරව පසුවෙති. පාපකාර විශ්වාසීන් අල්ලාහ්ගේ මතය පරිදි වේදනාවට ලක්වීමෙන් පසු ස්වර්ගයට පිවිසෙති.

ඒකදේවවාදීන් අතර අපායට නියමවූ පිරිස වෙනුවෙන් මැදි හත්වීම සඳහා අල්ලාහ් තමා කැමැතිවූ නබි (වක්තෘ)වරුන්ටද රසූල් (දූත)වරුන්ටද හා සාලිහීන්

(යහපත් ශීලීන්)ටද අවසරය ලබා දෙයි. ඒ අනුව ඔවුන්ගේ නිර්දේශයට පාත්‍රවූ පිරිස අල්ලාහ් නරකාදියෙන් පිටමන් කරයි. සිරාතය පසුකරමින් ගමන් කරන ස්වර්ග වැසියන් ස්වර්ගය හා අපාය අතර පිහිටි පාලමෙහි රැඳී සිටිති. එහි පිරිසක් තවත් පිරිසක් මගින් පළිගැනීමට ලක්වනු ලැබේ. පුද්ගලයෙක් තම සහෝදරයෙකුට කළ අපරාධය සඳහා පළිගැනීමට ලක්කර එමගින් ඔහු තෘප්තිවන තෙක් ස්වර්ගයට පිවිසීමට නොහැක.

ස්වර්ග වැසියන් ස්වර්ගයටද, අපාය වැසියන් අපායටද පිවිසී මෙන් පසු මරණය එළුවෙකුගේ රූපයෙන් ගෙනවිත් ස්වර්ගය හා අපාය අතර කපනු ලබන අතර, ස්වර්ග හා අපාය වසියන් මෙය දුටුවමින් සිටිති. පසුව 'ස්වර්ග වැසියනි, ඔබලාට මරණය නොමැති හෙයින්, ඔබලා ස්වර්ගයෙහි නිරන්තරයෙන් සිටින්න' යනුවෙන්ද, 'අපාය වැසියනි, ඔබලාටද මරණය නොමැති බැවින්, ඔබලාද නිරයෙහි නිරන්තරයෙන් සිටින්න' යනුවෙන්ද පැවැසේ. සැබැවින්ම, ප්‍රීතියෙන් මරණයට පත්වන්නේ ස්වර්ග වැසියන්ය. එසේම, දුකෙන් මරණයට පත්වන්නේ අපාය වැසියන්ය.

# අපාය හා එහි වේදනාව

අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿فَاتَّقُوا النَّارَ الَّتِيْ وَقُوْدُهَا النَّاسُ وَالْحِجَارَةُ ، أُعِدَّتْ لِلْكَافِرِيْنَ﴾

[البقرة: ٢٤]

*(අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන) කාෆිර්වරුන් සඳහා පිළියෙළ කරන ලද්දාවූත් ඉන්ධන වශයෙන් මනුෂ්‍යයන් හා පර්වත දවා ලන්නාවූත් ඒ ගින්නට බිය වන්න.*

*(අල්කුර්ආන්-2:24)*

නබි (සල්) තුමා තම ශ්‍රාවකරුවන්ට මෙසේ පැවැසීය.

[نَارُكُمْ هَذِهِ الَّتِيْ تُوْقِدُوْنَ جُزْءٌ مِنْ سَبْعِيْنَ جُزْءًا مِنْ نَارِ جَهَنَّمِ] قَالُوْا : وَاللهِ إِنْ كَانَتْ لَكَافِيَةً يَارَسُوْلَ اللهِ، قال : [فَإِنَّهَا فُضِّلَتْ بِتِسْعٍ وَسِتِّيْنَ جُزْءًا كُلُّهَا مِثْلُ حَرِّهَا] (رواه البخاري ومسلم)

නබිනායක මුහම්මදු (සල්) තුමා තම අනුගාමිකයන් අමතා 'ඔබලා දල්වන මෙම ගින්න ජහන්නම් යන නරකාදියෙහි ගින් නෙන් හැත්තෑවෙන් එක පංගුවෙකි' යනුවෙන් පැවැසීය. එවිට ඔවුහු අල්ලාහ්ගේ දූතයාණෙනි, 'එසේනම් (වේදනා කිරීමට) මෙය ප්‍රමාණවත්වේ' යැයි කීහ. එයට එතුමා 'නියත වශයෙන්ම මෙය (නිරයේ ගින්න) හැට නවය පංගුවෙන් වැඩිකර ඇත. ඒ සියල්ලම මෙවන් උණුසුම්ය' යනුවෙන් පැවැසීය.

අපාය මහල් ප්‍රසාද හතකින් සමන්විතකි. සෑම මහල්ලක්ම අනෙක් මහල්වලට වඩා අසීරු වේදනා සහිතව

පවති. එයින් සියළුම මහල්වලම තම තමන්ගේ පාප ක්‍රියාවන් අනුව වේදනා වට සූදුස්සන් සිටිති.

වේශධාරීන් පහළම මහලෙහි සිටිති. මෙය දැඩි වේදනා සහි තකි. කාෆිර් වරුන්ට තිරයෙහි වේදනාව අඛණ්ඩව හා ස්ථිරව පවතී. නමුදු ඔවුන් වේදනාව අධිකව භුක්ති විදීම සඳහා ඔවුන් අපායයෙහි දැවූ සෑම අවස්ථාවන්හිම නැවත පෙර තත්ත්වයට ගෙනෙනු ලැබේ. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

﴿كُلَّمَا نَضِجَتْ جُلُوْدُهُمْ بَدَّلْنَاهُمْ جُلُوْدًا غَيْرَهَا لِيَذُوْقُوا الْعَذَابَ﴾

[النساء:٥٦]

*ඔවුන් වේදනාව (සදාකාලිකව) භුක්ති විදීම සඳහා ඔවුන්ගේ හම් දැවියත (සෑම) අවස්ථාවන්හිම එය නොවන (වෙනත් නව තම) හම් ඔවුන්ට මාරුකරමින්ම සිටින්නෙමු. (අල්කුර්ආන්-4:56)*

﴿وَالَّذِيْنَ كَفَرُوْا لَهُمْ نَارُ جَهَنَّمَ ، لايُقْضَى عَلَيْهِمْ فَيَمُوْتُوْا وَلايُحَفَّفُ عَنْهُمْ مِّنْ عَذَابِهَا،كَذَلِكَ نَجْزِىْ كُلَّ كَفُوْرٍ ﴾ [فاطر:٣٦]

ප්‍රතික්ෂේප කරන්නන්ට තිරයේ ගින්න (පිළියෙලකර) ඇත. ඔවුන් මැරුම් දකින ආකාරයට ඔවුන්ගේ කාර්යයන් අවසන් කරනු නොලැබේ. තවද, තිරයෙහි ඔවුන්ගේ වේදනාවද පහසු කරනු නොලැබේ. මෙසේම සෑම කාෆිර් වරුන්ටම අපි කුලිය ලබා දෙන්නෙමු. (අල්කුර්ආන්-35:36)

එහි ඔවුන්ගේ බෙල්ලට විලංගු කරනු ලැබේ. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿وَتَرَى الْمُجْرِمِيْنَ يَوْمَئِذٍ مُّقَرَّنِيْنَ فِى الأَصْفَادِ، سَرَابِيْلُهُمْ مِّنْ قَطِرَانٍ وَتَغْشَى وُجُوْهَهُمُ النَّارُ﴾ [إبراهيم : ٤٩،٥٠]

තවද, එදින පාපකරුවන් දම්වැල්ලෙන් බැඳ සිටීම ඔබ දකී. ඔවුන්ගේ වස්ත්‍ර තාරවලින් (කීල් තෙල්) සාදා තිබේ. තවද, ඔවුන්ගේ මුහුණු ගින්නෙන් ආවරණයවී ඇති. *(අල්කුර්ආන් -14:49,50)*

අපාය වසින්ගේ ආහාරය ජක්කුම් ගසකි. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿إِنَّ شَجَرَتَ الزَّقُّوْمِ طَعَامُ الْأَثِيْمِ ، كَالْمُهْلِ يَغْلِيْ فِي الْبُطُوْنِ كَغَلْيِ الْحَمِيْمِ ﴾[الدخان : ٤٤-٤٦]

නියතවශයෙන්ම, (අපායේ ඇති) සක්කුම් ගස (එයම) පාප කරුවන්ගේ ආහාරයකි. එය උණුකරනලද තඹ සේ හා අධිකව රත්කරන ලද ජලය සේ ඔවුන්ගේ කුසෙහි උණුවේ. *(අල්කුර්ආන් -44:43,44)*

නබිනායක මුහම්මදු (සල්) තුමා මේ පිළිබඳව මෙසේ පවසන් නේය.

[لَوْ أَنَّ قَطْرَةً مِنَ الزَّقُّوْمِ قَطَرَتْ فِيْ دَارِ الدُّنْيَا لأَفْسَدَتْ عَلَى أَهْلِ الدُّنْيَا مَعَايِشُهُمْ فَكَيْفَ بِمَنْ يَكُوْنُ طَعَامُهُ ؟] [سنن الترمذي]

සක්කුම් ගසෙන් බිංදුවක් හෝ ලොවෙහි වැටෙන්නේ නම් ලොවැසියන් සැමගේ ජීවිතය විනාශයට පත්වේ. එසේනම් එය ආහාරය වුවන්ගේ තත්ත්වය කෙසේ පවතීද? *(ග්‍රන්ථය :තිර්මිදී)*

නරකාදියෙහි දුෂ්කර වේදනාව හා ස්වර්ගයෙහි භාග්‍යයේ විශේෂත්වය පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමාගේ වැකි යක් මෙසේ අනාවරණය වේ.

[ يُؤْتى بِأَنْعَمِ أَهْلِ الدُّنْيَا مِنَ الْكُفَّارِ فِي النَّارِ غَمْسَةً ثُمَّ يُقَالُ لَهُ : هَلْ مَرَّ بِكَ نَعِيْمٌ قَطُّ ؟ فَيَقُوْلُ : لاَ، مَا مَرَّ بِيْ نَعِيْمٌ قَطُّ. نَسِيَ كُلَّ نَّعِيْمِ الدُّنْيَا وَتَرَفَهَا مِنْ غَمْسَةٍ وَاحِدَةٍ فِي النَّارِ ، كَذَلِكَ يُؤْتى بِأَبْأَسِ أَهْلِ الدُّنْيَا مِنَ الْمُؤْمِنِيْنَ فَيُغْمَسُ فِي الْجَنَّةِ غَمْسَةً، ثُمَّ يُقَالُ لَهُ : هَلْ مَرَّ بِكَ بُؤْسٌ قَطُّ ؟ فَيَقُوْلُ : لاَ، مَا مَرَّ بِيْ بُؤْسٌ قَطُّ وَلاَ أَذًى. نَسِيَ كُلَّ مَا قَاسَاهُ فِي الدُّنْيَا مِنَ الْبُؤْسِ وَالْفَقْرِ وَالشَّقَاءِ مِنْ غَمْسَةٍ وَاحِدَةٍ فِي الْجَنَّةِ] (رواه مسلم)

මෙලොවෙහි සම්පූර්ණ භාග්‍යයෙන් ජීවත්වූ කාෆිර් වරයෙක් ගෙනෙනු ලැබේ. ඔහු නිරයේ (ගින්නෙ)හි වරක් ගිල්වනු ලැබී මෙන් පසු ඔහුගෙන් 'ඔබට (ලොවෙහි) කිසියම් භාග්‍යයක් තිබු ණේද ?' යැයි විමසේ. (එකළ ඔහු තමාට) කිසියම් භාග්‍යයක් හෝ නොතිබුණු බව පවසයි. නිරයෙහි වරක් ගිල්වීමෙන් ඔහුට ලොවෙහි භාග්‍යයන් සියල්ල අමතකවීය.

එසේම, මෙලොවෙහි ඉතාමත් අසීරුතාවයට ලක්වූ විශ්වාස වන්තයෙක් ගෙනෙනු ලැබේ. ඔහු වරක් ස්වර්ගයෙහි ගිල්වීමෙන් පසු ඔහුගෙන් 'ලොවෙහි ඔබට කිසියම් අසීරුතාවයක් හෝ තිබු ණේද? යනුවෙන් විමසේ. (එයට ඔහු තමාට) කිසියම් අසීරුතා වයක් හෝ දුෂ්කරතාවයක් හෝ නොතිබුණු බව ඔහු පවසයි. ස්වර්ගයෙහි වරක් ගිල්වීමෙන් ඔහුට ලොවෙහි ඇතිවූ

දිළිඳුකම, අසරණකම හා අභාග්‍ය සියල්ලම අමතකවිය. *(ග්‍රන්ථය : මුස්ලිම්)*

# ස්වර්ගයෙහි ස්වභාවය

ස්වර්ගය අල්ලාහ්ගේ යහපත් දාසයන්ගේ කීර්තිමත් ස්ථිර නිවසකි. එහි කිසියම් ඇසක් නොදුටු, කිසියම් කණක් නොඇසූ හා කිසියම් මිනිස් සිතකින් වර්ණනා කළ නොහැකි භාග්‍ය යන් තිබේ. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿فَلاَ تَعْلَمُ نَفْسٌ مَّا أُخْفِيَ لَهُمْ مِنْ قُرَّةِ أَعْيُنٍ ، جَزَاءً بِمَا كَانُوْا يَعْمَلُوْنَ﴾

[السجدة:١٧]

එබැවින් ඔවුහු කළ ක්‍රියාවන් සඳහා කුලිය වශයෙන් (ලබා දීමට) සඟවා ඇති නෙත් පිනවීම කිසියම් කෙනෙකු නොදනී. *(අල්කුර්ආන්-32:17)*

ස්වර්ගයේ ස්වභාවය විශ්වාස වන්තයින්ගේ ක්‍රියාවන් අනුව උස් හා පහත් තත්වයෙන් පවතී. අල්ලාහ් පවසන්නේය.

﴿يَرْفَعِ اللهُ الَّذِيْنَ آمَنُوْا مِنْكُمْ وَالَّذِيْنَ أُوْتُوا الْعِلْمَ دَرَجَات﴾ [المجادلة : ١١]

ඔබලා අතර සිටින විශ්වාස වන්තයින්ගේද දැනුම් ඥානය ලද අයගේද තරාතිරම අල්ලාහ් උසස් කරයි. *(අල්කුර්ආන්-58:11)*

ස්වර්ග වාසීන් තම සිත්සතන් ප්‍රිය කරන සෑම දේ එහි අනු භව කරති. පාට නොවෙනස්වන ගංගාවන්ද රස

නොවෙනස්වන කිරි ගංගාවන්ද පවිත්‍ර මී පැනි ගංගාවන්ද හා පානය කරන් නන්ට තෘප්තිය හා සතුට ගෙන දෙන මද්‍ය පාන ගංගාවන්ද එහි පිහිටා ඇත. එම මද්‍ය පානය මෙලොවෙහි මිනිසුන් පානය, බුද්ධිය මුලාකරන මද්‍ය පානය සේ නොවන්නේය. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

﴿يُطَافُ عَلَيْهِمْ بِكَأْسٍ مِنْ مَعِينٍ ، بَيْضَاءَ لَذَّةٍ لِلشَّارِبِينَ ، لاَ فِيهَا غَوْلٌ وَلاَ هُمْ عَنْهَا يُنْزَفُونَ﴾ [الصافات:٤٥-٤٧]

පිරිසිදු (මද්‍ය) පානය පිරී කෝප්ප ඔවුහු වටකර පැමිණේ. (එය) තද සුදය. පානය කරන්නන්ට මිහිරි රසය ඇති කරයි. එහි (කිසියම්) පීඩාවක් හෝ නොමැති අතර, (එමගින්) ඔවුහු බුද්ධි නොසන්සුන්තාවයටද නොපසුවෙති.
*(අල්කුර්ආන් -37:45-47)*

ස්වර්ග වැසියන්ට එහි 'හූරුල් ඊන්' කන්‍යාවන් විවාහ කර දෙනු ලැබේ. නබිනායක මුහම්මදු (සල්) තුමා මේ ගැන මෙසේ පවසන්නේය.

[لَوْ أَنَّ إِمْرَءَةً مِنْ أَهْلِ الْجَنَّةِ إِطَّلَعَتْ عَلَى أَهْلِ الْأَرْضِ لأَضَاءَتْ مَا بَيْنَهُمَا – أي السَّمَاءُ وَالْأَرضُ – وَلَمَلأَ تْهُ رِيْحًا] [رواه البخاري]

ස්වර්ග වැසියන්ගේ කන්‍යාවන්ගෙන් කෙනෙක් ලොව වැසි යන් අතරට පැමිණෙන්නේ නම්, ඇය අහස හා පොළොව අතර ආලෝකමත් කර, සුගන්ධයෙන් පුරවයි.
*(ග්‍රන්ථය : බුහාරි)*

ස්වර්ග වැසියන්ගේ උතුම්වූ භාග්‍ය වන්නේ, තම ස්වාමියාවූ අල්ලාහ්ව බැහ දැකීමකි. ඔවුන් ස්වර්ගයෙහි

මලමූත්‍රා පහකිරීම, නාහය සීරීම හා කෙළ ගැසීම යනාදීන් නොකරති. ඔවුන්ගේ පනාව රත්රන් වන අතර, ඔවුන්ගේ දහඩිය කස්තූරි වශයෙන් පවතී. මෙය කිසියම් අඩුවීමක් හෝ විසන්ධිවීමක් හෝ නොවන ස්ථිර භාග්‍යයන්ය. නබිනායක මුහම්මදු (සල්) තුමා මේ ගැන මෙසේ පවසන්නේය.

[مَنْ يَدْخُلِ الْجَنَّةَ يَنْعَمْ لاَ يَبْأَسْ لاَ تَبْلَى ثِيَابُهُ وَلاَ يَفْنَى شَبَابُهُ] (رواه مسلم)

ස්වර්ගයට පිවිසන්නා භාග්‍යය ලබයි. කිසියම් දුර්භාග්‍යයට හෝ නොලක්වේ. ඔහුගේ ඇඳුම් පැළඳුම් දිරා නොපත්වේ. ඔහු ගේ යෞවනය විනාශ නොපත්වේ.

*(ග්‍රන්ථය : මුස්ලිම්)*

ස්වර්ග වැසියන්ගේ අවම භාග්‍යය, මෙම ලොව දස වතාවක් ලබාදීමට වඩා ඔවුන්ට උතුම්ය. මෙවන් භාග්‍යය ලබන්නා අපා යෙන් සිට අවසානව පිටත්ව ස්වර්ගයට පිවිසෙන තැනැත්තාය.

***මහා කරුණික හා අති දයාවන්ත ස්වාමිණී,***

***මෙම උතුම්වූ භාග්‍ය හා දායාදයන්***

***ලබා දෙනු මැනවි***

***අප සැමට ......***

وصلى الله على نبينا محمد وعلى آله وصحبه وسلم،
والحمد لله رب العالمين.